සැ. යු.- 2013.0927 දින පළ වූ අංක 1,830 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,831 - 2013 ඔක්තෝබර් මස 04 වැනි සිකුරාදා - 2013.10.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1890 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1896 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ඔක්තෝබර් මස 25 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ඔක්තෝබර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### අකුරැස්ස ප්‍රාදේශීය සභාව

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | පොදු සුදුසුකම් |
|---|---|---|---|---|
| ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රා.ප.ච. 6/2006 අනුව PL 2(2006A) වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් වීම.<br><br>තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලැබීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. | ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.<br><br>විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.<br><br>අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.<br><br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය. |
| විදුලි කාර්මික | 01 | රා.ප.ච. 6/2006 අනුව PL 2 -(2006A) වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | එම | එම |
| කාර්යාල කාර්ය සහායක | 01 | රා.ප.ච. 6/2006 අනුව PL 1 -(2006A) වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පොස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වීම. | එම |
| පුස්තකාල සහායක | 01 | රා.ප.ච. 6/2006 අනුව PL 1 -(2006A) වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පොස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම. | එම |
| ආදාහනාගාර සහායක | 01 | රා.ප.ච. 6/2006 අනුව PL 1 -(2006A) වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම. | එම |
| සෞඛ්‍ය කම්කරු | 03 | රා.ප.ච. 6/2006 අනුව PL 1 -(2006A) වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්වීම | එම |

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | පොදු සුදුසුකම් |
|---|---|---|---|---|
| රියදුරු | 01 | රා.ප.ච. 6/2006 අනුව PL 3 -(2006A) වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06ක් සමත්වීම.<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනලද බලපත්‍රයක් සහ නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය. (අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතු ය.) | |

වෙනත් :

1. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
2. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
3. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.
4. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

බඳවා ගැනීමේ ක්‍රමය :

1. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
2. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
2. වැන්දඹු අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
3. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
4. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කරනු ලබන ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරන ලද අයදුම්පත් 2013.11.21 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අකුරැස්ස ප්‍රාදේශීය සභාව, අකුරැස්ස" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

01. උප්පැන්න සහතිකය;
02. අධ්‍යාපන සහතික;
03. පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය; (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතු ය.)
04. මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක්;
05. පළපුරුද්ද පිළිබඳ සහතික;
06. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

පී. ජී. පියල් රණදේව,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2013 සැප්තැම්බර් මස 12 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————————.
03. ස්ථිර පදිංචි ලිපිනය :——————————.
04. දුරකථන අංකය :——————————.
05. දිස්ත්‍රික්කය :——————————.
06. උපන් දිනය:
    වර්ෂය:—————— . මාසය:—————— . දිනය:—————— .
07. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
08. අයදුම්පත් භාර ගන්නා දිනට වයස :——————————.
    අවුරුදු:—————— . මාස:—————— . දින:—————— .
09. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
10. විවාහක/අවිවාහක බව:——————————.
11. ජාතිය :——————————.
12. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද, එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද? :——————————.
13. අධ්‍යාපන සුදුසුකම් :——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | 5.<br>6.<br>7.<br>8. | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.
15. ඔබ දැනටමත් අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්

    දැනට දරන තනතුර :——————————.
    එම තනතුරට පත්වූ දිනය:——————————.
    එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මතද):——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු වන බවත්, පත් වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරුවන ........................................................................................................................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ ...................................................................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :——————————.

10-36

## කල්පිටිය ප්‍රාදේශීය සභාව

කල්පිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ 111 ශ්‍රේණියට අදාල පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

| අනු . අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01. | විදුලි කාර්මික | 01 | PL3-2006A | රු.12,470 - 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 - රු.18,860 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්වී තිබීම. අවම වශයෙන් එක් වතාවකදී විෂයය්න 05ක් සමත් විය යුතුයි.<br><br>තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරනු ලබන වෘත්තීය පුහුණුව පිළිබඳ N.V.Q.4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වයස 03ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (අදාළ සහතික මගින් සනාථ කළ යුතුය.) |
| 02. | පුස්තකාල උපස්ථායක | 02 | PL1- 2006A | රු.11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 10 x 160 - රු.17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් 02ක් සමත් විය යුතුයි. (වෛකල්පික විෂයන් හැර) |
| 03. | ක්ෂේත්‍ර කම්කරු/ වැඩ කම්කරු | 01 | PL1- 2006A | රු.11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 10 x 160 - රු.17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් 02ක් සමත් විය යුතුයි. (වෛකල්පික විෂයන් හැර) |
| 04. | මුරකරු | 01 | PL1- 2006A | රු.11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 10 x 160 - රු.17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් 02ක් සමත් විය යුතුයි. (වෛකල්පික විෂයන් හැර) |
| 05. | රියදුරු | 03 | PL3- 2006A | රු.12,470 - 10 x 130 -10 x 145 10 x 160 - 12 x 170 - රු.18,860 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්වී තිබීම.<br>අවම වශයෙන් එක් වතාවකදී විෂයන් 05ක් සමත්විය යුතුයි.<br>තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 34ට වඩා ගෙන යා හැකි බස් රථ පමණක් පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබීම. (ඒ පංතියේ රියදුරු බලපත්‍රයක් ) රියදුරයෙකු ලෙස වසර 3ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 06. | සෞඛ්‍ය පරිපාලක | 01 | PL1- 2006A | රු.11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 10 x 160 - රු.17,600 | අ.පොස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයයන් 02ක් සමත් විය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර) |

*පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
(ii) අයදුම්කරු කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අනුගාමී වසර 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්දහිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුයි.)
(iii) කල්පිටිය ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් යන පදනම මත සේවය කරනු ලබන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
(iv) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුයි.
(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුයි. (මෙකී තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක් සඳහා අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුයි.
(vii) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් පසු සුදුස්සන් තොරා ගනු ලබයි.
(viii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කල්පිටිය ප්‍රාදේශීය සභාව සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
(iii) පත්වීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර වසර තුන අවසානයේදී අවශ්‍ය අනිකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇතිනම් මෙම පත්වීම ස්ථිර කරනු ලැබේ.
(iv) මෙම බඳවා ගැනීමේ ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් චක්‍රලේඛ හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතුය.

ඉල්ලුම් කළ යුතු ආකාරය :

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරන ලද අයදුම්පතක් 2013.10.21 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, කල්පිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලම් රකන ලබන තනතුර ............................................. යන්න සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල කල්පිටිය ප්‍රාදේශීය සභාව සතුය.

තනතුරු වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙනම වෙනම ඉල්ලුම්පත් එවිය යුතු වේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකය;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්;
(v) පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය ;
(vi) කල්පිටිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකය;

එම්. ඩබ්. කුලතුංග,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

2013 ඔක්තෝබර් මස 01 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව, කල්පිටිය.

## ආදර්ශ අයදුම්පත්‍රය

**කල්පිටිය ප්‍රාදේශීය සභාවේ ............................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
3. ලිපිනය:——————————.
4. දුරකථන අංකය :——————————.
5. උපන් දිනය :——————————.
6. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:——————. මාස:——————. දින:—————— ——.
8. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
9. විවාහක/අවිවාහක බව:——————————.
10. ජාතිය :——————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පාරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද? යන වග:——————————.
12. අධ්‍යාපන සුදුසුකම්:——————————.
13. සුදුසුකම් සහ පළපුරුද්ද:——————————.
14. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ කරන්නේ නම් -
    (i) දැනට දරන තනතුර:——————————.
    (ii) එම තනතුරට පත්වූ දිනය:——————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය :——————————. (ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්)
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු වී ඇත්නම් එම වරද හා ගනු ලැබූ දඬුවම් පිළිබඳ විස්තර ?:—————— ——————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් හා නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි.

මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කාරණයක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි. එම සියලු කොන්දේසිවලට මා යටත් වන බවද මෙයින් සහතික වෙමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ........................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා මෙකී අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————,
තනතුර:——————————,
නිල මුද්‍රාව :——————————.

10-47

# පළාත් පාලන නිවේදන

## ඇල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රජා ජල සම්පාදන සම්බන්ධවන අතුරු ව්‍යවස්ථා වන දැන්වීම්

ඇල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 ජූනි මස 27 වැනි දින පවත්වන ලද ඇල්ල තීරණ අංක 03 ඃ 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභාසම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. සුනිල් ගාමිණී,
සභාපති,
ප්‍රාදේශීය සභාව - ඇල්ල

2013 අගෝස්තු මස 15 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය සභාව.

**යෝජනාවයි**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ, ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1794/12 හා 2013.07.22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලද්දාවූ මේ අතුරු ව්‍යවස්ථා "ප්‍රජා ජල සංවිධාන විසින් කළමනාකරනය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අතුරු ව්‍යවස්ථා" යනුවෙන් හඳුන්වනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වැනි වගන්තිය 9 වන උප වගන්තිය ලැබී ඇති බලතල ප්‍රකාරව ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිළිගැනීමටත්, ක්‍රියාත්මක කිරීමටත් බල පැවැත්විය යුතු අතරු ව්‍යවස්ථාව වශයෙන් මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඇල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේ ය.

මෙම සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපනය කිරීමේදී සම්මත අතුරු ව්‍යවස්ථාවේ යෙදෙන සභාව, සභාපතිවරයා, ලේකම්වරයා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන යෙදුම් වලින් ඇල්ල ප්‍රාදේශීය සභාව, ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් සහ ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වන්නේ ය.

10-166

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

2013.02.22 වන දින අංක 1799 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත "පළාත් පාලන නිවේදන - දික්වැල්ල ප්‍රාදේශීය සභාව" යටතේ කරනු ලැබූ නිවේදනයට අළුතින් කොටසක් එකතු කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) (ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව කිරිනැලිය රදම්පල පාරේ රත්නාවල පැරණි දහම් පාසල අසල සිට රත්නාවල ගල්හේන්ගොඩ පාරට වැටෙන අතුරු මාර්ගය දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත්වලින් එක් මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලබයි.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2013 සැප්තැම්බර් මස 18 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

උපලේඛනය

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *මාර්ගයේ දිග (මීටර්)* |
|---|---|---|---|
| කිරිනැලිය රදම්පල පාරේ | කිරිනැලිය රදම්පල | රත්නාවල | 680.75 |

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *මාර්ගයේ දිග (මීටර්)* |
|---|---|---|---|
| රත්නාවල පැරණි දහම් පාසල අසල සිට රත්නාවල ගල්හේන්ගොඩ පාරට වැටෙන අතුරු මාර්ගය | පාර | ගල්හේන්ගොඩ පාර | |

10-152

---

## පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව

1975 අංක 17 දරන පනතේ කමිටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනයයි

පහත ශීර්ෂයේ සඳහන්කර ඇති පුද්ගලයන්ගේ ඉඩමේ ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කමිටුව 2014 වර්ෂයේ පවත්වා ගෙනයාමට ඉහත අයිතිය ලබා දෙන පනතේ 06 වන වගන්තියට අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

එම අයිතිය ලබාදීමට යෝජනා කර ඇති කමිටුව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළකරයි නම්, ගැසට් නිවේදනයේ පළකර ඇති දින සිට සති 04 ක් ඉක්මවා යාමට පෙර ලිඛිත පිටපත් 02 කින් මා වෙත එවිය යුතු බව දන්වමි.

| *අයදුම්කරුගේ නම සහ ලිපිනය* | *කමිටුවේ සභාපති ද ලේකම්ද, කළමනාකරුද යන වග* | *කමිටුවේ නම* | *කමිටුව පවත්වාගෙන යාටම සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| පොන්නයියා සෙල්ව ක්‍රිෂ්නන් පුලෝලි - දකුණ පුලෝලි | ලේකම් | පුලෝලි ක්‍රීඩා සමාජය | මන්දිගෙයි පුලෝලි දකුණ පුලෝලි |

පී. සංජීවන්,
සභාපති,
පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභාව,
පේදුරුතුඩුව,
පුලෝලි.
2013.08.21

10-167

---

## වලිගාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව පුත්තූර්

1975 අංක 17 දරන පනතේ කමිටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනයයි

පහත ශීර්ෂයේ සඳහන් කර ඇති පුද්ගලයින්ගේ ඉඩම්, ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කමිටුව 2014 වර්ෂයේ පවත්වාගෙන යෑමට ඉහත අයිතිය ලබාදෙන පනතේ 06 වන වගන්තියට අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

ඉහත අයිතිය ලබා දීමට යෝජනා කර ඇති කමිටුව පවත්වාගෙන යෑමට තීරණය කර ඇති ඉඩම අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළකරයිනම්, ගැසට් නිවේදනය පළකර ඇති දින සිට සති හතරක් ඉක්මයෑමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

| *අයදුම්කරුගේ නම සහ ලිපිනය* | *කමිටුවේ සභාපති ලේකම්ද කළමනාකරු ද යන වග* | *කමිටුවේ නම* | *කමිටුවේ පවත්වාගෙන යෑමට සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| සිවප්‍රකාෂම් සිවරූබන් කුවිල් පුලෝලි දකුණ පුලෝලි | ලේකම් | රෝයල් ක්‍රීඩා සමාජය | වුන්නාගම් පාර පුත්තූර් |

අ. උදයකුමාර්,
(කළමනාකරු).

ප්‍රාදේශීය සභාව,
වලිකාමම් නැගෙනහිර,
පුත්තූර්.

10-101

**මදුරාවල ප්‍රාදේශීය සභාව**

මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි මදුරාවල ප්‍රාදේශීය සභාවට අයත් හොරණ කළුතර පාරේ හොරණ සිට කළුතර දෙසට ඉවුඩුගොඩ, එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම මහතාගේ සහ අමරදාස ලියන්වල මහතාගේ නිවාස අතරින් වමට ආරම්භවන, නාත් විජේමාන්න මහතාගේ සහ සුනිල් ප්‍රේමචන්ද්‍ර මහතාගේ නිවාස අසලින් අවසන් වන, ඉවුඩුගොඩ හරස් මාර්ගය "රණවිරු දුමින්ද ගමගේ මාවත " ලෙස නම් කිරීමට පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ඇති බව සියලු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කොට පළකරනු ලැබේ.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මදුරාවල ප්‍රාදේශීය සභාව

2013 සැප්තැම්බර් මස 12 වෙනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-40/1

---

**මදුරාවල ප්‍රාදේශීය සභාව**

මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි මදුරාවල ප්‍රාදේශීය සභාවට අයත් කඳාන හංදියේ සිට කි. මී. 11/2 ක් ඉළිඹ දෙසින් ඩබ්. එම්. සමරනායක මහතාගේ ඉඩම හා තේ ඉඩම අතරින් දකුණට ආරම්භ වන සහ අයි. ඩබ්. කුලදාස මයාගේ නිවස අසලින් අවසන් වන, (කොස්හේන පාරට සම්බන්ධ වන ස්ථානය දක්වා) කඳාන උතුර මැණික්ගොඩැල්ල පාර "රණවිරු මාවත" ලෙස නම් කිරීමට පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ඇති බව සියළු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කොට පළකරනු ලැබේ.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මදුරාවල ප්‍රාදේශීය සභාව

2013 සැප්තැම්බර් මස 12 වෙනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-40/2

---

**1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත විනෝද කටයුත්තක් කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුකරන සෑම තැනැත්තකු විසින්ම එම විනෝද කටයුත්ත -

(1) සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට අටක (8%) ප්‍රමාණයට සමාන විනෝද බද්දක් ;

(2) වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකරගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දොළහක් (12%) ප්‍රමාණයට සමාන විනෝද බද්දක්.

කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ වගන්තියේ (1) වෙනි උප වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කැකිරාව ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වන දින සම්මත කර ඇති අංක 2011-435 යෝජනාව උතුරුමැද පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය එස්. එම්. රංජිත් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියෙන් (2) වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද මෙයින් නිවේදනය කරමි.

එස්. එම්. රංජිත් සමරකෝන්,
උතුරු මැද පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2013 අගෝස්තු මස 13 වැනි දින,
අනුරාධපුරදී ය.

10-39

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතුය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමලේඛනය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිලදී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| ඔක්තෝබර් | 2013.10.04 | සිකුරාදා | 2013.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.11 | සිකුරාදා | 2013.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.17 | බ්‍රහස්පතින්දා | 2013.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.25 | සිකුරාදා | 2013.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2013.11.01 | සිකුරාදා | 2013.10.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.11.08 | සිකුරාදා | 2013.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.15 | සිකුරාදා | 2013.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.22 | සිකුරාදා | 2013.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.29 | සිකුරාදා | 2013.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2013.12.06 | සිකුරාදා | 2013.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.13 | සිකුරාදා | 2013.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.20 | සිකුරාදා | 2013.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.27 | සිකුරාදා | 2013.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.